
ලංකාදීප
වාණිජ ලෝකය
ආර්ථිකය, වෙළෙඳපොළ, මූල්‍ය නව ප්‍රවණතා


157



# අලුත් ජනපතිට ව්‍යාපාර අභියෝග

**2019 මැයි 1 වැනිදායින් අවසන් වූ මාස 12ක කාලපරිච්ඡේදය තුළ රටවල් 190 ක ව්‍යාපාර කටයුතු ක්ෂේත්‍ර 10ක් යොදාගෙන සකස් කළ ව්‍යාපාර කිරීමේ පහසුව පෙන්නුම් කරන දර්ශකයට** (Ease of doing business Index) **අනුව ශ්‍රී ලංකාව ව්‍යාපාර කිරීමේ පහසුව අතින් දකුණු ආසියාවේ අනිකුත් රටවලට සාපේක්ෂව දරුණු පසුබැස්මක් පෙන්නුම් කරයි. (සංඛ්‍යාන සටහන 1 බලන්න.) ඒ අනුව 2020 දී තේරී පත්වන අලුත් ජනාධිපතිට ව්‍යාපාර ඉහළ නැංවීමේ අභියෝගයකටද මුහුණ දීමට සිදුවේ.**



**දකුණු ආසියාව තුළ ශ්‍රී ලංකාව ව්‍යාපාර දර්ශකය - 2019**

| රට | 2018 ස්ථානය | 2019 ස්ථානය | ස්ථානය වැඩි/අඩු වීම |
|---|---|---|---|
| ශ්‍රී ලංකාව | 100 | 99 | +1 |
| ඉන්දියාව | 77 | 63 | +14 |
| නේපාලය | 110 | 94 | +16 |
| පාකිස්ථානය | 136 | 108 | +28 |
| බංග්ලාදේශය | 176 | 168 | +8 |
| ඇෆ්ගනිස්ථානය | 167 | 173 | - 6 |

(මූලය ලෝක බැංකුව)

2015 ශ්‍රී ලංකාවේ ව්‍යාපාර කිරීමේ පහසුව පෙන්නුම් කළ දර්ශකයට. අනුව 99 වැනි ස්ථානය හිමි කර ගෙන තිබුණු අතර 2016 දී එය 110 වැනි ස්ථානයට ගමන් කර ස්ථාන 11 කින් පසු බැසීමක් වාර්තා විය. 2017 දී 111 වැනි ස්ථානය හිමිකරගෙන ස්ථාන 1 කින් පසුබසින ලදී. 2018 දී එම ස්ථානය 100 දක්වා ස්ථාන 11කින් ඉහළ නංවා ගැනීමට සමත් වුවද 2019 දී දකුණු ආසියාවේ අනිකුත් රටවල් වන පාකිස්ථානය ස්ථාන 28කින් නේපාලය ස්ථාන 16කින් ඉන්දියාව ස්ථාන 14කින් බංග්ලාදේශය ස්ථාන 8කින් ඉහළ නංවා ගෙන තිබෙන තත්ත්වයක් තුළ ශ්‍රීලංකාවේ තත්ත්වය ඉහළ නංවා ගැනීමට හැකි වූයේ ස්ථාන 1 පමණි. ඇෆ්ගනිස්ථානය ද තම ස්ථානය 6 කින් අඩුකර ගැනීමේ තත්ත්වය තුළ ශ්‍රීලංකාව දෙවැනි වුණේ ඇෆ්ගනිස්ථානයට පමණි.

දකුණු ආසියාතික රටවල් අතර ව්‍යාපාර පවත්ගෙන යාමේ දර්ශකය යටතේ 2020 සඳහා ලංකාව ලබා ගත් ලකුණු සංඛයාව 61.8කි. 2019 දීද එම සංඛ්‍යාවේම පසු විය. දකුණු ආසියාවේ රටවල් ශ්‍රේණිගත කිරීම් අනුව ඉන්දියාව පළමු රට වී 63 වැනි ස්ථානයේ පසු විය. භූතානය 89 වැනි ස්ථානය ලබාගෙන දෙවැනි රට බවටද නේපාලය 94ක් ලබා තෙවැනි රට බවටද පත් වූ අතර ශ්‍රී ලංකාව 99ක් ලබා සිවුවන රට බවට පත්විය. පකිස්ථානය 108ක් ලබා පස්වන රට බවටද මාලදිවයින 147 වන ස්ථානය ලබාගෙන හයවන රට බවටද බංග්ලාදේශය 168 ක් ලබා හත්වන රට බවටද ඇෆ්ගනිස්ථානය 173ක් ලබා අටවන රට බවටද පත්විය.

ව්‍යාපාර කිරීමේ පහසුව පෙන්නුම් කරන දර්ශකය යනු ලෝකයේ විවිධ රටවල ව්‍යාපාර ආරම්භ කිරීමටත් ඒවා පවත්වාගෙන යෑමටත් ඇති පහසුව හා අපහසුව පෙන්නුම් කරන දර්ශකයකි. මෙය සකස් කරනු ලබන්නේ ජාත්‍යන්තර මූල්‍ය සංස්ථාව හා ලෝක බැංකුව එක්වයි. 2020 මෙම දර්ශකය සකස් කිරීමට ද පහත දැක්වෙන ක්ෂේත්‍ර 10 (කලින් තිබුණේ ක්ෂේත්‍ර 9ක්) සැලකිල්ලට ගෙන තිබේ.

- ව්‍යාපාරයක් ඇරැඹීමේ පහසුව
- ගොඩනැගිලි ඉදිකිරීමේ බලපත්‍ර ලබා ගැනීම
- විදුලිය ලබා ගැනීමේ පහසුව
- ණය ලබා ගැනීමේ පහසුව
- සුළු පරිමාණ ආයෝජකයන් ආරම්භ කිරීම




ප්‍රවීණ ආර්ථික විශ්ලේෂක
වින්සන් මර්වින් ප්‍රනාන්දු


- බදු ගෙවීම
- දේශ සීමා හරහා වෙළඳාම් කිරීම
- ගිවිසුම් බලාත්මක කිරීම
- ගැටලු නිරාකරණය
- දේපල ලියාපදිංචිය

මෙම දර්ශක 10ට ස්ථාන බර තැබීමක් දී තිබේ. වෛද්‍ය දර්ශකයක් සකස් කිරීමේ වාසි කිහිපයකි. ඵලදායිතාව වැඩිවීම රැකියා අවස්ථා ජනනය වීම විදේශීය ආයෝජන ආකර්ශණය කර ගැනීමට හැකි වීම විවිධ අංශයේ සමාගම් වේගයෙන් දියුණු වීම. ගිවිසුම් බලගැන්වීමේ ගුණාත්මක බව ඉහළ යෑම එම වාසිය.

මෙබඳු දර්ශකයක් පවත්වාගෙන යෑමේ සීමා ද තිබේ. සර්ව ආර්ථික ස්ථායිතාව ආරක්ෂාව ආයතනයේ ශක්තිමත් භාවය යටිතල පහසුකම්වල ගුණාත්මක භාවය දේශීය වෙළෙඳ පොළ ප්‍රමාණය පවත්නා දූෂණ තත්ත්වය ශ්‍රම බලකායේ නිපුණතාව එම සීමාවන්ය.

සමාන තත්ත්වයක් පවතින කලාපීය රටවල් හා සසඳන විට නව ව්‍යාපාර ඇරැඹීමේදී ගිවිසුම් බලගැන්වීමේදී දේපළ ලියාපදිංචි කිරීමේදී හා ණය ලබා ගැනීමේදී අධික නිලධාරිවාදයක් ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක වන නිසාත් 2015 සිට ශ්‍රී ලංකාවේ ආර්ථික වර්ධනය සියයට 5 සිට සියයට 2.6 දක්වා අඩුවී ගෙන යෑම නිසාත් 2019 අප්‍රේල් 21 පාස්කු ඉරිදා සිදුවූ ප්‍රහාරය නිසාත් මහ බැංකු බැඳුම්කර මගඩිය හරහා රටේ පොලී අනුපාතය ඉහළ යෑම හා විදේශ ආයෝජන විශ්වාස. පහළ යෑම නිසාත් මූල්‍ය ආයතන හරහා ණය ලබා ගැනීම දුෂ්කර වීම නිසාත් විටින් විට විදුලිය කපා හැරීම නිසාත් බදු පරිපාලය හා රජයේ අකාර්යමතාව නිසාත් ශ්‍රී ලංකාවේ ව්‍යාපාර කිරීමේ පහසුව අඩපණ වීම සිදුවිය.

මේ තත්ත්වය තුළ 2020 බලයට පත්වන ජනාධිපතිවරයට හා ඔහු යටතේ පත්වන ආණ්ඩුවට ජනතාවට ලබා දුන් කෙළවරක් නැති පොරොන්දු ඉටු කිරීම් අතරට අලුත් අභියෝගයක් ලෙස මෙසේ අඩපණ වූ ව්‍යාපාර ඉහළ නැංවීමේ අලුත් අභියෝගයක්ද මතු වී තිබේ. ඒ තත්ත්වයෙන් ව්‍යාපාර ගොඩ ගැනීමට නම් බිඳ වැටුණු ආර්ථික වර්ධනය වහාම ඉහළ නැංවීමට පියවර ගැනීමත් නැති වූ ආරක්ෂාව යළි ලබා දීමත් බිඳ වැටුණු විදේශ සෘජු ආයෝජන දිරි ගැන්වීමත් රටේ මූල්‍ය අංශය ශක්තිමත් කිරීමත් වහාම සිදුකළ යුතුව ඇත. ඒ සඳහා සුදුසු ජනාධිපතිවරයා සහ ආණ්ඩුව අතීත අත්දැකීම්වලට අනුව තෝරා බේරා ගැනීම ජනතාව සතු වගකීමකි.